# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1788/37 - 2012 දෙසැම්බර් මස 14 වැනි සිකුරාදා - 2012.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කොළඹ මහ නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොටගෙන කොළඹ නගර සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මොහමඩ් මහරූෆ් නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ , ඒ පක්ෂයට අයත් ඒ කොළඹ මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන රත්නායක මුදියන්සේලාගේ තුෂාර හේමන්ත මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කොළඹ මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරි හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, රත්නායක මුදියන්සේලාගේ තුෂාර හේමන්ත මහතා කොළඹ මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම්භාර නිලධාරි,
කොළඹ මහ නගර සභාව.

2012 දෙසැම්බර් මස 13 වැනි දින,
කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය,
රාජගිරිය.

12 - 909

1A - G 17027— 350 (2012/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.